**කොවිඩ්-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා තුන්වන අතිරේක මූල්‍යනය - 2023**

---

**කොවිඩ් -19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා තුන්වන අතිරේක මූල්‍යනයේ** 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව සමග එළඹි, 2021 සැප්තැම්බර් 24 දිනැති අංක පීජ්ඩී 4691 දරන ලෝක බැංකු වාර්තාවේ 40 වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම ප්‍රකාරව, සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. **COVID-**19 එන්නත් සඳහා දැරිය හැකි සහ සාධාරණ ප්‍රවේශයක් කඩිනමින් ස්ථාපනය කිරීම සහ එන්නත් පද්ධතිය ශක්තිමත් කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ ඵලදායී අන්දමින් එන්නත් යෙදවීම සහතික කිරීම සහ මව් ව්‍යාපෘතිය යටතේ සූදානම් කිරීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාකාරකම් තවදුරටත් ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු විය. මෙම ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,000 ට සමාන එ.ජ.ඩො. මිලියන 100 ක් මූල්‍යකරණය කිරීමට ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව එකඟ විය. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2021 සැප්තැම්බර් 27 වන දින ආරම්භ කරන ලද අතර 2023 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතය.

## 1.3 මතය

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහයන් පිළිබඳ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධව වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 පද්ධති සහ පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ලෝක බැංකු දූත කණ්ඩායම විසින් 2023 නොවැම්බර් 21 සිට 27 දක්වා ව්‍යාපෘතියේ අවසාන ක්‍රියාත්මක කිරීමේ සහාය මෙහෙයුම සිදු කර තිබුණි. එහිදී, තෙවන අතිරේක මූල්‍යකරණයේ ඉතිරි අරමුදල් අත්‍යවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා නැවත වෙන් කරන ලද නමුත් එම එ.ජ. ඩොලර් 5,462.5 ඒ සඳහා භාවිතා කර නොතිබුණි.. | ලෝක බැංකු (WB) මෙහෙවර කණ්ඩායම 2023 නොවැම්බර් 21 සිට 27 දක්වා CERHSP ව්‍යාපෘතියේ අවසාන ක්‍රියාත්මක කිරීමේ සහාය මෙහෙයුම සිදු කරන තිබුණි. ප්‍රතිව්‍යූහගත කිරීමේ ක්‍රියාවලිය, උප සංරචක 1.3 (ණය අංකය: IBRD 9296) (එන්නත් උපසංරචකය) (තෙවන අතිරේක මූල්‍යකරණය) හි ඉතිරි අරමුදල් කොවිඩ්-19 Global Multipha යටතේ සුදුසුකම් ලබන අතිරේක අත්‍යවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ක්‍රමලේඛන ප්‍රවේශ රාමුව යටතේ නැවත වෙන් කරන ලදී. මෙය තවදුරටත් වසංගත සූදානම සඳහා සහාය වීම සහ සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා සිදු කරන තිබුණි. මේ නිසා විශේෂ ඩොලර් ගිණුමේ ශේෂය වූ ඇමෙරිකානු ඩොලර් 5,462.50 ආපසු නොගෙවන ලදි. තුන්වන අතිරේක මූල්‍ය ණය ගිවිසුම 9296 අනුව, ණය අවසන් දිනය 2023.12.31 විය. 2024 අප්‍රේල් 30 දක්වා ලබා දී ඇති ව්‍යාපෘති සහන කාලය තුළ, විශේෂ ඩොලර් ගිණුම-217 හි ශේෂය වූ ඇමෙරිකානු ඩොලර් 5,462.50 ක් 2024 මාර්තු 13 දින ආපසු ගෙවන ලදී. | සම්පූර්ණ ප්‍රතිපාදනය භාවිතා කළ යුතුය. |